නාවික භටයාගේ විවාහ සංවත්සරය

මුලස්ථානයෙන් ලැබුණු සංඥාව කියවූ සිරිමෙවන් එය රැගෙන ආ සංඥාකරු තම කුටියෙන් පිටවී තරප්පු පෙළින් බැස නොපෙනී යනතුරු බලා සිටියේය. ඉන්පසු සිය අසුනේම මොහොතක් එම ඉරියව්වේම සිටි ඔහු සෙමින් හිස ඔසවා තම කුඩා මේසයට ඉහළින් එල්ලා ඇති පුවරුව දෙස නෙත් හෙළීය.

සමන් ලැලු දිවි පෙවෙතේ, කොටසක් දය සමය වෙතේ
පුදහොසකලොත් එයින් පුතේ, මෙලොවට සිසි පලක් නැතේ

එස්. මහින්ද හිමි

මීට වසරකට පමණ පෙර තමන්ගේම අත් අකුරින් ලියා සකස් කරන ලද එම පුවරුවේ ඇති අකුරුවල පාට දුර්වර්ණ වී ඇති සෙයක් ඔහුට දැනිණි. අකුරුවල නැවතත් තීන්ත ආලේප කළයුතු යැයි ඔහු සිතුවේය.

සංඥා පණිවිඩය නැවත අතට ගත් ඔහු තම කුටියෙන් නික්ම තරප්පු පෙළින් නැගගොස් සුක්කානම් මැදිරියට පිවිසුණි. සුක්කානම් කිසිම ආයාසයකින් තොරව හසුරුවන නැවියාගේ පිටට සෙමින් තට්ටු කරමින් ඔහු ඉදිරිපස වූ මාලිමා යන්ත්‍රයට නෙත් යොමුකොට ගමන් කරන දිශාව නිවැරදි බවට සහතික කර ගත්තේය. පාලක මැදිරියේ දකුණු පස රාජකාරියේ යෙදෙන නැවියා දුර දක්නයකින් අවට සියාරමින් සිටී. රේඩාර් යන්ත්‍රයේ දර්ශනපථය නිරීක්ෂණය කරමින් සිටින්නේ පුහුණුවට අනුයුක්තව ඇති මධ්‍ය නිලධාරියෙකි. නෞකාවේ විධායක නිලධාරී සිතියම් මේසයෙහි සිතියමක් මත සමාන්තර රූල චලනය කරමින් ගමන් මගෙහි වෙනස් කළයුතු දිශාව ගණනය කරමින් සිටී. සිරිමෙවන් පාලක මැදිරියේ වම් පසට ගොස් අවට බැලීය.

නෞකාවේ ඇණිය මුහුද දෙබෑකරමින් ඉදිරියට ඇදෙයි. ගොඩබිමින් සැතපුම් 200 ක් පමණ ඈත නිසා ධීවර යාත්‍රාවක ලාම්පු එළියක් හෝ දක්නට ලැබෙන්නේ කලාතුරකිනි. හිරු අස්ථයට ගොස් පැයක් පමණ වන නමුදු හඳ එළිය නිසා අවට එළිය වැටී ඇත. අද මුහුද කෙතරම් ශාන්තද? නිසසල මුහුදට සඳඑළිය වැටුනු විට මොනතරම් නම් චමත්කාර ජනකද? මීට දින දෙකකට පෙර ඔහු මෙතනම රැඳී සිටියේ නැව් බඳ අල්ලාගෙන ඉතාමත් අපහසුවෙනි. මුහුද එතරම් රළුය. ආහාරද පිසගත නොහී සියලු දෙනාම ආහාරයට ගත්තේ විස්කෝතු පමණි. නමුත්, අද? මුහුදේ ස්වභාවය එයයි. මීට වසර ගණනාවකට පෙර වෙනස්වන සුර් සාගරය, ගැහැනියට සමාන කරමින් තමා ලියූ කවි පෙළක කවි දෙකක් ඔහුගේ මතකයට නැගුණි.

සුදුපෙන කැටිති මවනා මහ සයුර අගේ
හිනැහෙන 'දසත් විහිද' යුවතියක වගේ
පෙරළෙන, සැලෙන, පැද්දෙන, රළ පෙළෙහි රගේ
වාගේ නොවෙද 'නිති චංචල' මනස ඇගේ?

නිසලවූ සවිවූ කිලුනත් අද සයුරු ඉම
රැදුවෙස් ගති නොව නොදනිම් කරුණ කිම
මෙතරම් අගය කල සුන්දර ඇයගෙ පෙම
මියගිය කරුණ අද තවමත් නොයම් මම...

'මේ, හැම ගැහැනියෙක්ම එහෙමයි කියලද ඔයා හිතන්නේ'? විවාහ වෙන්න පළමුව රේණුකා එම කවිපෙළ කියවා තමාගෙන් ඇසූ අයුරු ඔහුට සිහිපත් විය. 'ඒකනම් හරියට කියන්න බැහැ, නමුත් මේවා පණ්ඩිතයන් විසින් කියපු දේවල්' සිරිමෙවන් පිළිතුරු දුනි. 'ඒ ඔක්කොම ඉතින් බූරි වැදිච්ච පණ්ඩිතයෝ වෙන්න ඇති' කියමින් ඇය සිනාසුනු අයුරු ඔහුට තවම මතකය.

සිරිමෙවන් නැවත සඳ දෙස බැලීය. තව දින දෙකකින් සඳ පූර්ණවේ. පසළොස්වක පොහොය උදාවේ. මේ මොහොතේ රේණුකාද දරු දෙදෙනා සමග ගෙයි මිදුලේ සිට සඳ දෙස බලමින් ඇහිලි ගනිමින් සිටින හැටි ඔහුට මැවී පෙනෙයි. හෙට දින මුර සංචාරය අවසන් වී වරායට ගොස් නිවාඩු ගෙන නිවසට ගිය විට පොහොයට එක්ව පන්සල් යාහැක. ඊටත් වඩා විශේෂම දෙය නම් පොහොයට පසුවද එළඹෙන ඔවුන්ගේ දසවන විවාහ සංවත්සරයයි. විවාහ වී වසර දහයක් ගෙවුණද සංවත්සරය දිනයන්හි ඔහුට නිවසේ සිටීමට හැකි වූයේ දෙවතාවක් පමණි. එයින්ද අවසාන වතාව එළැඹුනේ මීට වසර හයකට පෙරය. පසුගිය වසර හයේදීම විවාහ සංවත්සරය දින බිරිඳ සමග ගත කිරීමට නොහැකි වූ නිසා මෙවර කෙසේ හෝ එදිනට තමාට නිවාඩු ලබාගැනීම සඳහා ඔහු මාස කිහිපයක සිට මනාව සැලසුම් කළේ තම සෙසු අණදෙන නිලධාරීන්ගේද සහය ඇතිව මුර සංචාරයන්හි දින නැවත සකස් කිරීමෙනි. ඒ වෙනුවෙන් මේ මාසය තුළ අතිරේක මුහුදු චාරිකාවක් සිටීමටද ඔහු ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් විය. මෙවර තම නෞකාව වරායෙන් පිට වීමට මොහොතකට කලින් දුරකථනයෙන් තමා ඇමතූ බිරිඳ සංවත්සර උත්සවයට ආරාධනා කිරීමට අදහස් කරන නෑ හිත මිතුරන්ගේ නම් ලැයිස්තුවක්ම ඔහුට පවසා ඊට අනුමැතිය ලබා ගත්තාය. වසර හයකට පසු මෙවන් දිනයක් සැමරීමට මෙවර අවස්ථාවක් ලැබෙන හෙයින් ඇය ඉහවහා ගිය සතුටකින් කථා කරන්නේ යැයි ඔහුට සිතිනි. ඒ දින දහතරකට පෙරය. ගොඩබිමින් ඈත නිසා ජංගම දුරකථනයට සංඥා ලැබෙන්නේ නැති බැවින් ඇයගේ කටහඬ පවා ඔහුට මෙතෙක් අසන්න ලැබුණේ නැත. හෙට දිනය උදාවන තුරු ඔහුද නොඉවසිල්ලෙන් බලා සිටියේ එබැවිනි.

සිරිමෙවන් නැවත සංඥා පත්‍රිකාව දිග හරිමින් සඳ එළියේම එය [illegible] ඉදිරි දින කිහිපය තුළ අවි-රැගත් නෞකාවක් මලක්කා තීරය පසුකර උතුරට ගමන් කරන බැව් විශ්වාසනීය ආරංචි මාර්ග පවසයි. එම ආයුධ බහුදින ධීවර යාත්‍රා වලට බෑමට ඉඩ ඇති බැවින් තව දින හතක් මුහුදේ රැඳී සිටින්න. විමර්ශනය කළ යුතු පෙදෙස පසුව දන්වනු ලැබේ.' ඔහු ඉතා පුවේසමෙන් සංඥාව කියවා එය නවා තම කමිසයේ ඉදිරිපස සාක්කුවේ රුවා ගති... 'සර්' නෞකාවේ රේඩාර් යන්ත්‍රය හසුරුවන මධ්‍ය නිලධාරියාගේ හඬට ඔහු හැරී බැලුවේය. 'සර් ඉතා ලොකු යාත්‍රාවක් වගේ එකක් රේඩාර් එකේ පෙනෙනවා ඊසාන දිශාවට වේගය නිස්පහක් පමණ' සිරිමෙවන් හිසසලා සුක්කානම් මැදිරියට ගොස් රේඩාර් යන්ත්‍රයේ දර්ශන පථයට නෙත් යොමු කළේය. රේඩාර් යන්ත්‍රය ක්‍රියාත්මක වනුයේ විද්‍යුත් චුම්බක තරංග මගිනි. විකාශනය වන එම තරංග මුහුදේ තිබෙන ඕනෑම දෙයක වැදී නැවත පරාවර්තනය වී නෞකාවේ රේඩාර් දර්ශන පථය මත විවිධ හැඩ මගින් සලකුණු කරයි. අත්දැකීම් බහුල නිලධාරියකුට එම ලකුණු දුටු පමණින්ම එය කුමන මාදිලියේ යාත්‍රාවක්ද යන්න ක්ෂණයකින්ම පැවසිය හැක. 'මේක විශාල නෞකාවක ප්‍රමාණයේ ලකුණක්' සිරිමෙවන් ඉතා ලාබාල පුහුණු මධ්‍ය නිලධාරියාට කීය. 'මෙතරම් විශාල නෞකාවකට මේ තරම් වේගයකින් කවදාවත් මුහුදේ ගමන් කරන්න බැහැ. ඒක නිසා මෙය මුහුදු මට්ටමට ආසන්නව පියාඹන කුරුලු රංචුවකින් පරාවර්තනය වන ලකුණක් වෙන්න පුළුවන්. තව හොඳට බලාගෙන ඉන්න. තව විනාඩි කිහිපයකින් මෙය නැතිවෙලා ගියොත් ඒ කියන්නේ ඒක නෞකාවක් නෙවී'

සිරිමෙවන් යළි තමන් සිටි තැනට පැමිණ කල්පනා සයුරේ නිමග්න විය. මෙවන් අසහනකාරී අවස්ථාවල බොහෝ විට කවිය තමාට සහනයක් වූ අයුරු ඔහුට මෙනෙහි විය. එසේ වන්නේ තම බිරිඳ කවියට ඇලුම් කරන නිසා විය යුතුය. එසේම ඇය හොඳ බිරිඳකි. තම සැමියාගේ රාජකාරියේ ස්වභාවය කදිමට තේරුම්ගත් ශ්‍රියා කාන්තාවකි. ඔහුගේ අසරණ බව කවියකින් එළිදක්වූ විට එය වුවමනාවටත් වඩා අගය කරන්නේ ඒ නිසාම බැව් ඔහු හොඳින් දනී. අප්‍රේල් මස පළවෙනි දින එනම් බක් මහ ඇරඹුන දිනයේද සිරිමෙවන් සිටියේ මුහුද මැදය.

අවියක් දෙඅත් වල රඳවා විඩාවෙන
පිටිසැන් පහන් වනතුරු නෙත් යොමාගෙන
සවියක් නැතත් දුන් මට නැසියෝ දනා
නැවියන් හටත් බක් මාසය උදවුනා!

නෙතවී ගියත් ගනසැඩ රළ මාරුතයේ
එක්වී බිඳිමු ඔද රැප්පෙන් මාරකයේ
අත්සරගත නොහැකි උණුසුම ආදරයේ
බක්මහ කියා. වෙනසක් නැහැ 'සාගරයේ'

සිංහල අවුරුදු දිනද ඔහුට නිවසේ සිටීමට නොහැකි විය. නෞකාව වරායට පැමිණියේ අප්‍රේල් 10 වනදාය. නිවාඩු යාමට සූදානම් වූ මොහොතේම ඔහුට නැවතත් මුහුදට යාමට සිදුවූයේ යාන්ත්‍රික දෝෂයක් නිසා මුහුදේ අතරමංව තිබෙන ධීවර යාත්‍රාවක් සෙවීමටය. සිංහල අවුරුදු නිවසේ සිටීමට නොහැකි වුවද මුහුද මැද දින ගණනාවක් කුසගින්නේ සිටි ධීවර පිරිස සොයා ඔවුනට පිහිට වීමට ලැබීම ගැන සිරිමෙවන්ට දැනුනේ අසීමිත ප්‍රීතියකි. අවුරුදු ද ඔහු ඇයට ලියූ කවිය මෙසේය.

සයුර සිපගෙන හමන සුලඟේ නැවුම් සුවඳක් වෙදයි සිතුනා
මිදුතු කරදිය පවනෙ මුසුවී හිසෙහි සුපුරුදු විලස රැඳුනා
නැකත එළඹෙන විටදි 'අවුරුදු' සිතට එවිතර බවක් දැනුනා
'නොනගතේදිත් නොනැවතී' අපි සයුරු රළපෙළ මැදින්
ඇදුනා....

'සර් රේඩාර් එකේ අර ලකුණ නොපෙනී ගියා.' මධ්‍ය නිලධාරී නැවතත් ඔහු වෙත පැමිණ පැවසීය. 'හොඳයි දැන් දන්නවානේ රේඩාර් එකට නැව් පමණක් නෙවී. මුහුදු මට්ටමේ තිබෙන ඕනෑම වස්තුවක් පෙනෙනවා. මීට පස්සේ ඒ ගැනත් අවධානය යොමු කරන්න ඕන.'

සිරිමෙවන් අහස දෙස බැලීය. සඳ දිලෙන විට කෙතරම් නම් ආනන්ද ජනකද? 'ඔරයන්' තාරකා පද්ධතිය යසට ස්ථාන ගත වී ඇති අන්දම කෙතරම් අපූරුද? එකොළොස්වන ශත වර්ෂයේ පළවන පරාක්‍රමබාහු රජුගේ කාලයේ අපේ නාවික හමුදාව බුරුමය ආක්‍රමණය කිරීම සඳහා ත්‍රිකුණාමලයෙන් පිටත් වී ගමන් කළේ මෙවන් වූ තාරකා පද්ධතීන් ආශ්‍රයෙන් නොවේද යැයි සිතන හැම මොහොතකම ඔහුට මහත් වූ අභිමානයක් දැනේ. සයුරු රළ පෙළ මත නැලවෙමින්, සඳතරු පහස විඳ ගනිමින් සිතුවිලි සයුරේ මොහොතකට ගිලුනද එම සුන්දර වාතාවරණය එක් මොහොතකින් කනපිට පෙරළිය හැකි බැව්ද ඔහු දනී. සතුරු යාත්‍රා හමුවුව හොත් අනිවාර්යයෙන්ම යටත් කර ගැනීම සඳහා සටන් කළ යුතු බැවිනි. මරාගෙන මැරෙන බෝට්ටුවක් උන් සතුව ඇත්නම් එවන් සටනක් ඉතාමත් තීරණාත්මක වනු ඇත. කවියක් ලිවීමට නම් හිත සම්පූර්ණයෙන්ම නිදහස්ව ශාන්තව තිබිය යුතුය. කෙසේ වුවද තාවකාලික විරාමයකදී වුවද මෙවන් අසීරුම් අවස්ථාවන් හිදී සුන්දර කවි සිතිවිලි අවදි කිරීමට තමන්ට ඇති ශක්තිය ගැන ඔහු අවංකවම සතුටු වූයේ එබැවිනි.

අද නම් දියණියද සඳ එනතුරු මගබලා සිටින බැව් ඔහු දනී. තම දියණිය මෙලොවට බිහිවූද ඔහු සිටියේ ගොඩ බිමට සැතපුම් 50 ක් පමණ දුරිනි. එදිනද සඳපායා තිබිණි. මුහුදද ඉතා ශාන්ත විය. දියණිය වෙනුවෙන් ලියූ කවි දෙකක් ඔහුට හොඳහැටි මතකය.

සිහිනි පොත් ටික තුරුලු කරගෙන සුදු ගවුමකින් සැරසිලා
දෙකම්මුල්වල පුයර තවරා වරල මැද්දෙන් පීරලා

මවගෙ අතගෙන පාදෙක සිහිනි ඔසවමින් පාසල බලා
යවන දිනයක් උදවන තුරු බලා ඉන්නෙමි පුල පුලා...

'රටක් කෙලෙසුනු වැලැක්වීමට සයුර මත්තේ වෙහෙසෙමි
ඔයත් වෙනුවෙන් දයත් වෙනුවෙන් ගතේ දහදිය වගුරමි
මව්බිමේ මතු 'සිරිය' රැක්මට තුටින් සටනට පිවිසෙමි
ඔබේ දිවියේ 'අසිරි' දක්මට ඉඳිදෝ මා නොදනිමි...

'ඇයි ඔයා ඒවගේ කවියක් ලිව්වේ ඔයා හරි නරකයි' දියණිය පළමු වරට බැලීමට නිවසට ගිය විට රේණුකා ඔහුට බැණ වැදුනාය. ඒ තමයි කවි රසය, ශෘංගාරය, කවියකුගේ හද ගැස්ම ඇති ඇති මීට පස්සේ නම් ඒවගේ කවි විහිලුවටවත් ලියන්න එපා හොඳද?

දියණිය බලා නැවත සේවයට ගිය සිරිමෙවන්ට මාස දෙකහමාරක් යනතුරු නොයෙක් නොයෙක් රාජකාරීන් නිසා නිවාඩු ගැනීමට නොහැකි විය. එක් වරක් තවත් නිලධාරියෙකුගෙ බිරිඳට අසනීප වූ නිසා ඔහුගේ නිවාඩුව ස්වේච්ඡාවෙන්ම කැප කිරීමට යෙදුනි. බොහෝ විට මුහුදට ගොස් පැමිණියද ආරක්ෂක හේතුන් මත කෙටි දැනුම් දීමකින් නැවත මුහුදට යා යුතුව තිබූ නිසාද ඔහුට නිවාඩු ලබාගත නොහැකි විය. නිවසේ දුක සැප දැන ගත්තේ දුරකථනයෙන් පමණි. මාස දෙකකට පසු බිරිඳ සනසාලීම සඳහා ඔහු ලියූ කවි මෙසේ විය.

ඔබට ඇති මගේ පෙම දිනෙන් දින මේරුවේ
ඔයත් නැහැ කිසි දිනක මගේ සිත පැරුවේ
ටික දිනක් වෙන් වුවත් ඉන්න මට හැකි වුවේ
ඔබේ රුව ඇති නිසයි මගේ හද සිරුවේ...

ඔබේ දෑතින් පිසුනු කෑමක් කන්න හතිකට එන්නෙමි
එසේ ඇවිදින් ඔබේ විකසිත මුව කමල සිප ගන්නෙමි
කිසර යුගලක් වන් ලැමැද මත මගේ වත හිල් වන්නෙමි
වසර ගනනක් වුවද ඒ ලෙස සිටිනැකියි මං දන්නෙමි.

එවර නිවාඩුවට ගෙදර ගියවිට රේණුකා ඔහුට දෙහි කපන්නට පටන් ගත්තාය. 'ඔයා හිතන්නේ කවියක් ලියලා එව්වාම ඔක්කොම හරි කියලාද? දරුවට මාස 03 ක් කිට්ටු වෙන්නත් ආවා. පිටරටක ගිහින්නම් කමක් නැහැ. ඔයා වැඩ කරන්නේ හරියට ඔයා නැති නම් නාවික හමුදාව වහන්න වෙනවා වගේ. දුවත් අසනීප වුනා දෙපාරක්ම...' ඇය කියාගෙන කියාගෙන ගියාය. 'ඇය කෙතරම් අවලාද නැඟුවත් ඒ තරහවකින් නොවන බැව් ඔහු දනී. රාත්‍රී ආහාර ගත් පසු දියණියද උකුලේ තබාගෙන ඇය තුරුල් කරමින් සිරිමෙවන් බිරිඳ ඇමතීය. 'මුහුදට ගිය දවස්වල හැර අනික් දවස්වල හැමදාම වගේ මම ඔයාට දුරකථනයෙන් කථා කළා. ඔයා ඇයි මට කිව්වේ නැත්තේ දුව අසනීප වුනාය කියලා'? රේණුකා දියණියගෙන් නිකටින් සොලවා සිනාසුනී. 'දුගේ තාත්තා දොස්තර නෙවිනෙ. එයා දන්නේ නැව් ගැන විතරයි', කියමින් සිරි මෙවන් දෙස බැලූවාය.' ඔයා බයවෙයි කියලා කිව්වේ නැත්තේ. ඔයා හොඳ සිහින් රාජකාරි කරන කෙනෙක්. ගෙදර සුළු ප්‍රශ්න වලින් ඔයාගෙ හිතට කරදර දෙන්න මම කැමති නැහැ.' සිරිමෙවන්ගේ නෙතට කඳුලක් නැගිණි. ඇය කෙතරම් හොඳ සෙබල බිරියක්ද? විවාහ වී ගෙවුණු දස වසර තුළ ඔහුට කොළඹ සේවය කරන්න ලැබුනේ මාස 08 ක් වැනි සුලු කාලයක් පමණි. එය නාවික හමුද මුලස්ථානයේ මාණ්ඩලික නිලධාරියෙක් ලෙසිනි. එම කාලය තුළ දිනපතා සේවයට යන විට තම බිරිඳ උදේ පාන්දරින් නැගිට ඔහුට දිවා ආහාරය පිළියෙල කොට ඔතා දුන්නේ මොනතරම් නම් සතුටකින්ද? එහෙත් ජනවාරි මස 01 වන දින සිට ත්‍රිකුණාමලයට ඔහුට මාරුවක් ලැබුණේ ඔහු නොසිතූ අයුරිනි. මුලස්ථානයේ සේවයේ අවසන් දින, පෙර පරිදිම, දිවා ආහාරය අවසන් වරට ඔහු අත තබන විට තමා පෙර දින රාත්‍රියේ ඇයට ලියූ කවිය කියවා ඇය ඉකි බිඳිමින් හැඬූ අයුරු ඔහුට තාම මතකය.

මාරුව ලබා කොළඹට ආ දිනේ සිට
දුන්නා දිවා බත්පත දිනපතා මට
ගියවිට 'මලේ' එන වසරේ මුලේ සිට
එය සිහිවෙලා සත්තයි දුක සිතේ මට....

පවුලේ සියලුම කටයුතු තම බිරිඳ විසින් තමන්ගේ කිසිම සහයක් නොමැතිව කර ඇති අයුරු ඔහුට සිහිපත් වෙයි. දරුවන්ගේ පාසැල් කටයුතු, ගුරුදෙගුරුන් හමුව, ත්‍යාග ප්‍රදාන උත්සව, මංගල/අවමංගල උත්සව මේ සියල්ලටම බොහෝ විට ඇය සහභාගි වූයේ තනිවමය.

එයද කිසිදු පැමිණිල්ලක් නොක්කාඩුවක් නොමැතිවය. කරුණු ඒ නිසාම ඔහු මෙවර දසවෙනි සංවත්සරය උත්කර්ෂවත් අන්දමට සැමරීමට තීරණය කළේ ඇයට සැනසීමක් ලබාදෙනු පිණිසමය. ඇයට තිළිණයක් ගත්තේ මෙවර මුහුදට පැමිණීමටත් පෙරය.

නෞකාව වරායෙන් පිට වීමට මොහොතකට කලින් ඔහු ඇමතූ රේණුකා සංවත්සර උත්සවයට සම්බන්ධ සියලු කරුණු ඔහුට පැවසුවේ කෙතරම් සතුටකින්ද? අනිත් සියලු අවස්ථා වලට වඩා මෙවර ඔහුට නිවසට ඒමට නොහැකි බැව් දැනගත් විගස රේණුකාට මහත් වූ ශෝකයක් දැනෙනු නිසැකය. කිසිදාක නොදැනුන තරමේ සිත් වේදනාවක් ඔහුට දැනුණේ එබැවිනි.

'සර්' මෙවර ඔහු කල්පනාවෙන් මිදුනේ නෞකාවේ ඉංජිනේරුවරයාගේ හඬටයි. 'සර්, අපේ විදුලි ජනක දෙකෙන් එකක් සම්පූර්ණයෙන්ම ක්‍රියා විරහිත වුනා. අවශ්‍ය අමතර කොටස් නෞකාවේ නැහැ, තිබුණත් මුහුදේ අලුත්වැඩියා කරන්න බැහැ. දින පහක් වත් වරායක ඉන්න ඕනෑ. අනෙක් විදුලි ජනකයේ සුලු සුලු දෝෂ තියනවා. වතුරත් ඉතා සීමිත ප්‍රමාණයක් තියෙන්නේ. ඒ නිසා අපි අවසර අරගෙන වරායට ගියොත් හොඳයි කියලයි මගේ අදහස.

සිරිමෙවන්ට එක්වරම අමුතු සතුටක් දැනුණද ඔහු එය නොපෙන්වීමට වෑයම් කළේය. එක් විදුලි ජනකයකින් පමණක් ඈත මුහුදේ යාත්‍රා කිරීම භයානකය. මන්ද යම් හේතුවක් නිසා එයද ක්‍රියා විරහිත වුවහොත් නැවේ කිසිම උපකරණයක් ක්‍රියා කරවීමට නොහැකි නිසාය. එවිට රේඩාර් යන්ත්‍රය පමණක් නොව ප්‍රධාන අවිද ක්‍රියා කරවීමට නොහැක. එම අවදානම නිසා විදුලි ජනක දෙකක් පමණක් තිබෙන නෞකාවක එක් ජනකයක් අලුත්වැඩියා කිරීමට නොහැකි වන අන්දමින් ක්‍රියා විරහිත වුවහොත් එම නෞකාවට වහාම වරායට ඒමට අවසර ලැබේ. තීරණය ඔහු අතේය. මේ නම් ඔහුට දෙවියන් විසින්ම දුන් අවස්ථාවකි. වරායට ගිය වහාම අලුත්වැඩියාවට දින පහක් ගතවන බැවින් ඔහුට තමන් සැලසුම් කළ පරිදි නිවසට යාහැක. වසර හයකට පසුව සංවත්සරය එකට හිඳ සැමරිය හැක. රේණුකා කෙතරම් නම් සතුටට පත්වනු ඇද්ද?

සිරිමෙවන්ට හදිසියේ යමක් මතක්වූවාසේ කමිස සාක්කුවේ තිබූ සංඥාව ගෙන යළිත් වරක් ඒ දෙස බැලීය. තම නෞකාව මේ පෙදෙසින් දුන් ඉවත් වුවහොත් දින හතරක් පහක් යනතුරු වෙනත් නෞකාවක් මෙතනට ඒමට නොහැක. මුහුදේ අනෙක් පෙදෙස්වල ස්ථානගතව ඇති නෞකාවලට අමතරව වරායේ ඇති නෞකා දෙකෙන් එකක් අලුත්වැඩියා කරමින් පවතින අතර, ඉතිරි නෞකාවේ අණදෙන නිලදරී දැනට නිවාඩු මත සිටී. ඔහුගේ නිවාඩුව අවලංගු කළද ඔහුට මෙම ස්ථානයට ඒමට අඩු තරමින් දින අටනවයක් ගතවනු ඇත. තමාද මෙතැනින් ඉවත් වුවහොත් සංඥාවේ ඇති කාරණය සත්‍ය නම් සතුරා නිසිසේ ආයුධ ට්‍රෝලර් යාත්‍රා වලට බානු ඇත. එම ට්‍රෝලර් යාත්‍රා ගොඩබිමට නුදුරුව ඇති එවන් සිය යාත්‍රා ගණනකට මුසුවූ පසු ඔවුන්ව සොයා ගැනීම ඉතාම අසීරු වනු ඇත. මෙවන් තත්ත්වයක් මත තමා කළ යුත්තේ එක් විදුලි ජනකයකින් අවදානම් සහිතව වුවද මෙම ස්ථානයේම රැඳී සිටීමද නැතිනම් අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන වරායට යාමද?

සිරිමෙවන් නැවත අහස දෙස බැලීය. වේගයෙන් හමායන වලාපටකට මුවා වූ හඳ නැවතත් අනාවරණය විය. මෙවර සඳ පෙරටත් වඩා දීප්තිමත්ව බැබලෙනැයි ඔහුට සිතිනි. සිරිමෙවන් පාලක මැදිරියට ගොස් රේඩාර් යන්ත්‍රයේ නාවික දුර වෙනස් කරමින් මදක් අවට නිරීක්ෂණය කළේය. ඉන්පසු ඔහු තමාගෙන් පිළිතුරක් බලාපොරොත්තුව සිටින ඉංජිනේරුවරයා ඇමතීය. 'මුලස්ථානයට පණිවිඩයක් යවන්න සතුරු නෞකා සංඥාව මත අප එක් විදුලි ජනකයකින් තවදුරටත් මුහුදේ රැඳී සිටිනවායි කියා. අවශ්‍ය අමතර කොටස් වහාම වෙන යාත්‍රාවකින් මෙතනට එවන්න උපදෙස් දෙන්න. නැවියන්ට කියන්න ඉදිරි දින හත තුළ වතුර සීමා කරන්න කියා.' ඉංජිනේරුවරයා යමක් පැවසීමට තැත් කළද සිරිමෙවන් උපදෙස් දුන් විලාසය අනුව කවරක් කීවද පලක් නොවන බැව් වැටහීගිය බැවින්දෝ නිහඬ විය. සිරිමෙවන් සුක්කානම් මැදිරිය පසුකොට ගොස් තරප්පු පෙළින් බැස, නැවතත් තම කුටිය තුළට පිවිස කුඩා මේසය ඉදිරිපිට අසුන් ගත විගස දසවන විවාහ සංවත්සරය සැමරීමට පුලපුලා බලා සිටින බිරියගේ වත ඔහුට මැවී පෙණිනි. ඉන්පසු නැවෙහි බඳ නිසෙහි සවිකර ඇති විදුලි ලාම්පුව දල්වා පෑන අතට ගෙන බිරිඳ ට හසුනක් ලිවීමට පටන් ගති.

දස වසරක්ම විසුවා එක වහල යට
විරසක වුවත් වූයේ එක මොහොතකට
මට සැලකුවේ විලසිනි ඔබ රජෙකු හට
එය මට මතක් වෙයි සයුරේ සරණ විට

ගේ දොර තබා ඈත නිසිලෙස ක්‍රියාවෙනි
එහි සැපිසරයි ඔබ සිහිවුව විලාසිනී
රස මසවුලෙන් යුත් ආහාර සඳ දුනි
ඔබ හිමි වූනේ මම පින්කල නිසාවෙනී

ඒමට නොහැක දෙමසක මහද නැවරේ
එනමුදු තබනු මෙය ඔබ සිහිවිලි අතරේ
ජීවත් වෙලා සිටියොත් මා ප්‍රිය සොඳුරේ
සමරන හැටි බලනු එකලොස් වන වසරේ...!!

රියර් අද්මිරාල් සරත් වීරසේකර